සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25B S I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Third Term Test - Grade 13 - 2019**

විභාග අංකය .............................

# යුරෝපා ඉතිහාසය I

කාලය පැය තුනයි

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

## I කොටස

- **අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැලපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.**

01. 1. තීබ්ස් 2. කොරින්ත් 3. මිලේටස් 4. ස්පාර්ටා 5. මර්මරා (.....)

02. 1. සියුස් 2. ඇතීනා 3. ඇපලෝ 4. ජුපිටර් 5. ඇෆ්‍රඩයිට් (.....)

03. 1. පෙරික්ලීස් 2. නීරෝ 3. කොන්ස්ටන්ටයින් 4. ජස්ටීනියන් 5. මාකස් අවුරේලියස් (.....)

04. 1. ඔස්ට්‍රොගොත්වරු 2. විසිගොත්වරු 3. පැට්‍රීසියන්වරු 4. ඇංග්ලෝ සැක්සන්වරු 5. ලොම්බාර්ඩ්වරු (.....)

05. 1. රෂේස් 2. අවිසින්නා 3. ඕමාර්ඛයියාම් 4. අල්රාසි 5. අල්හසන් (.....)

06. 1. සෙම්ලේ 2. බොලොඤ්ඤා 3. නේපල්ස් 4. ඔක්ස්ෆර්ඩ් 5. පැරිස් (.....)

07. 1. තෝමස් හොබ්ස් 2. ජීන් බෝඩැන් 3. ජෝන් ලොක් 4. ජීන් ජැක්විස් රූසෝ 5. ප්‍රැන්සිස්කෝ ගුයිසියාඩිනි (.....)

08. 1. ක්‍රිස්ටෝපර් කොළම්බස් 2. ඇමෙරිගෝ වෙස්පුෂි 3. ෆර්ඩිනන්ඩ් මැගලන් 4. වස්කෝ ද ගාමා 5. ප්‍රැන්සිස්කෝ පිසාරෝ (.....)

09. 1. බොහීමියානු අවධිය 2. ඉතාලි අවධිය 3. ඩෙන්මාර්ක් අවධිය 4. ස්වීඩන් අවධිය 5. ප්‍රංශ අවධිය (.....)

10. 1. යෝක්ෂයර් 2. හොප්වෙල් 3. මායා 4. ඉන්කා 5. ඇස්ටෙක් (.....)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැලපේ. එම නොගැලපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන් තුල ලියන්න.**

11.
1. හෝමර් - වීර කාව්‍ය
2. ඇරිස්ටොෆනීස් - නාට්‍ය කලාව
3. හිපෝක්‍රටීස් - වෛද්‍ය විද්‍යාව
4. පයිතගරස් - ගණිත ශාස්ත්‍රය
5. සොක්‍රටීස් - මූර්ති කලාව (.....)

12.
1. උතුරු මුහුද සහ බෝල්ටික් මුහුද - කීල් ඇළ
2. කළු මුහුද සහ මර්මරා මුහුද - ඩාඩනල්ස් සමුද්‍ර සන්ධිය
3. මොරොක්කෝව සහ ස්පාඤ්ඤය - ජිබෝල්ට්‍රා සමුද්‍ර සන්ධිය
4. මධ්‍යධරණී මුහුද සහ රතු මුහුද - සූවස් ඇළ
5. අත්ලාන්තික් සාගරය සහ පැසිපික් සාගරය - පැනමා ඇළ (.....)

13.
1. වස්කෝද ගාමා - ඉන්දියාවේ කැලිකට් වරායට පැමිණීම
2. ක්‍රිස්ටෝපර් කොළම්බස් - බටහිර ඉන්දීය දූපත් සොයා ගැනීම
3. ෆර්ඩිනන්ඩ් මැගලන් - ලෝකය වටා යාත්‍රා කිරීම
4. චෙව්ප්ලෝන් මාක්විටේ - මිසිසිපි ගංගා මුවදොර
5. ජෝන් කැබේ - කේප් බ්‍රිටන් දිවයින (.....)

14.
1. නිකොලෝ මැකියාවෙලි - කුමාරයා (The Poince)
2. ඉග්නේෂස් ලොයොලා - අධ්‍යාත්මික අභ්‍යාස (Spiritual Exercises)
3. ජීන් බෝඩැන් - රාජ්‍ය පිළිබඳ පොත් 6 (Six books on the state)
4. ජීන් ජැක්විස් රූසෝ - සමාජ සම්මුතිය (The social contract)
5. ඇඩම්ස් ස්මිත් - නීතියේ සාරය (The spirit of the laws) (.....)

15.
1. ජෝන් හස් - බොහීමියාව
2. මාටින් ලූතර් - ජර්මනිය
3. ජෝන් කැල්වින් - ප්‍රංශය
4. උල්රිච් ස්විංග්ලි - ස්විට්සර්ලන්තය
5. ජෝන් වෙක්ලිෆ් - ඉතාලිය (.....)

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැලපෙන අනුපිළිවෙලට නොවේ. Y තීරුව X තීරුව සමඟ ගැලපෙන අනුපිළිවෙලට සකස්කල විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. එම නිවැරදි සංයෝගයට අයත් අංකය තෝර ඉදිරියේ ඇති තිත් ඉරමත ලියන්න.**

16.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ඇරිස්ටෝටල් | A | ස්වාධිපතිගේ බලය බෙදීමට හෝ හුවමාරු කිරීම කළ නොහැකිය. |
| 2. | මැකියාවෙල්ලි | B | මිනිසා තම ශ්‍රමයෙන් ගොඩනගා ගත් දේ ඔහුගේ පෞද්ගලික දේපළ වේ. |
| 3. | හොබ්ස් | C | ව්‍යවස්ථාදායක හා විධායක බලතල එක්තැන්ව පවතින විට එතැන නිදහස පැවතිය නොහැකිය. |
| 4. | ලොක් | D | මිනිසා දේශපාලන සත්ත්වයෙකි. |
| 5. | මොන්ටෙස්කියූ | E | පාලකයා විසින් සිංහයා හා හිවලා අනුකරණය කළ යුතුය. |

1. DAEBC 2. BEACD 3. DEABC 4. DEACB 5. EABCD (.....)

17.

| X | | Y | |
|---|---|---|---|
| 1. | බොස්ටන් තේ සාදය | A | පළමු ලෝක යුද්ධයේ ආරම්භය |
| 2. | බැස්ටීලය බිඳ දැමීම | B | නැපෝලියන් බොනපාට්ගේ ඇඳ වැටීම |
| 3. | රුසියානු ආක්‍රමණය | C | ඇමෙරිකානු විප්ලවය |
| 4. | සරායේවෝ ඝාතනය | D | දෙවන ලෝක යුද්ධයේ ආරම්භය |
| 5. | ජර්මනිය විසින් පෝලන්තය ආක්‍රමණය කිරීම | E | ප්‍රංශ විප්ලවය |

1. CEBAD 2. CEDBA 3. ECBAD 4. BECAD 5. EDBAC (.....)

18.

| X | | Y | |
|---|---|---|---|
| 1. | නැන්ටීස් ආඥාව | A | අටවන හෙන්රි රජතුමා |
| 2. | මහා ප්‍රඥාප්තිය (මැග්නා කාර්ටා) | B | ඇලෙක්සැන්ඩර් සාර් රජතුමා |
| 3. | රෙපරමාදු පාර්ලිමේන්තුව | C | දෙවන වික්ටර් එම්මානුවෙල් රජතුමා |
| 4. | වියානා සම්මේලනය | D | තුන්වන ජෝන් රජතුමා |
| 5. | ඉතාලිය එක්සත් කිරීම | E | හතරවන හෙන්රි රජතුමා |

1. EDBAC 2. EDABC 3. DEABC 4. CDBEA 5. BDAEC (.....)

19.

| X | | Y | |
|---|---|---|---|
| 1. | උත්කෘෂ්ට විප්ලවය | A | ලොව ප්‍රථම ජනාධිපති ආණ්ඩුක්‍රමය බිහිවීම. |
| 2. | ඇමෙරිකන් විප්ලවය | B | රජු අභිබවා පාර්ලිමේන්තුව ශක්තිමත්වීම. |
| 3. | ප්‍රංශ විප්ලවය | C | යුරෝපයේ ජාතිකවාදී හැඟීම් වර්ධනය. |
| 4. | 1848 විප්ලව | D | ලොව ප්‍රථම සමාජවාදී රාජ්‍ය බිහිවීම. |
| 5. | රුසියන් විප්ලවය | E | මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය එළි දැක්වීම. |

1. BAEDC 2. DAEBC 3. EABCD 4. CBEAD 5. BAECD (.....)

20.

| X | | Y | |
|---|---|---|---|
| 1. | මෙටර්නික් | A | ප්‍රශියාව |
| 2. | කාසල්රී | B | ප්‍රංශය |
| 3. | ඇලෙක්සැන්ඩර් සාර් | C | ඔස්ට්‍රියාව |
| 4. | චාල්ස් ටැලිරැන්ඩ් | D | බ්‍රිතාන්‍ය |
| 5. | තුන්වන පෙඩ්රික් විලියම් | E | රුසියාව |

1. EDABC 2. CDEBA 3. BDEAC 4. EDABC 5. CDEBA (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරින් එකක් අදාළ මාතෘකාවට නොගැලපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. ප්‍රොතෙස්තන්ත ව්‍යාපාරය,
    1. ජර්මනියෙන් ආරම්භ විය.
    2. ක්‍රිස්තු සභාවේ දූෂිත බවට විරුද්ධව පැන නැගිනි.
    3. ඉග්නේෂස් ලොයොලා විසින් ආරම්භ කරන ලදි.
    4. ටෙට්සල්ගේ පුණ්‍ය එල පත්‍රිකා විකිණීම ආසන්නම හේතුව විය.
    5. යුරෝපය පුරා ආගමික විප්ලවයක් ලෙස ව්‍යාප්ත විය. (.....)

22. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමය,
   1. මධ්‍යතන යුගයේ වංශවතුන්ගේ මහා සභාව පාර්ලිමේන්තු ක්‍රමයේ මූලාරම්භය වීම.
   2. ක්‍රි.ව. 1215 දී මැග්නා කාර්ටා ගිවිසුම මගින් රජුගේ බලය සීමා කිරීම.
   3. පළමුවන එඩ්වඩ් රජුගේ කාලයේ දී ආදර්ශ පාර්ලිමේන්තුව කැඳවීම.
   4. පළමුවන එළිසබෙත් රැජිණගේ කාලයේ දී ඒකාධිපති රාජාණ්ඩුව බිහි වීම.
   5. 1688 දී සිදු වූ උත්කෘෂ්ට විප්ලවයෙන් පාර්ලිමේන්තුවට බලය හිමි වීම. (.....)

23. ජර්මනිය එක්සත් කිරීම.
   1. නැපෝලියන් රයින් සංයුක්තය පිහිටුවීම.
   2. ප්‍රශියාව මුල් කරගෙන සොල්වරීනය පිහිටුවීම.
   3. ෆ්‍රැන්ක්පර්ට් පාර්ලිමේන්තුව.
   4. ප්‍රශියාවේ මූලිකත්වයෙන් සිදුවීම.
   5. මෙටර්නික් ගේ ලේ සහ යකඩ ප්‍රතිපත්තිය. (.....)

24. ජාතීන්ගේ සංගමය.
   1. පළමුවන ලෝක යුද්ධයෙන් පසුව පිහිටුවන ලදි.
   2. ප්‍රධාන අරමුණ වූයේ සාමකාමීව ගැටුම් විසඳා ගැනීම සහ නැවත යුද්ධයක් ඇතිවීම වළක්වා ගැනීමයි.
   3. ඇමරිකානු ජනාධිපති වුඩ්රෝ විල්සන්ගේ සංකල්පය මත බිහිවිය.
   4. යුද ගැටුම් වැලැක්වීමට ජාත්‍යන්තර සාම සාධක හමුදාවක් පිහිටුවන ලදි.
   5. මහ බලවතුන් අතර එකඟතාවක් නොමැති වීමෙන් අරමුණු බිඳ වැටිනි. (.....)

25. නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය
   1. දෙවන ලෝක යුද්ධයෙන් පසුව බිහි වූ දේශපාලන සංවිධානයකි.
   2. බටහිර අධිරාජ්‍යවාදයෙන් නිදහස ලැබූ තුන්වැනි ලෝකයේ රටවල් සාමාජිකයන්වීම.
   3. ඇමෙරිකානු මූල්‍යාධාර ලබාගැනීමට කටයුතු කිරීම.
   4. ඉන්දීය අගමැති ජවහර්ලාල් නේරු ඉදිරිපත් කළ පංචශීල ප්‍රතිපත්තිය පදනම් කර ගැනීම.
   5. සමාජවාදී හා ධනවාදී කඳවුරු දෙකටම අයත් නොවූ මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තිය. (.....)

- **අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (A), (B), (C), හා (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

  A හා B පමණක් නිවැරදි නම් අංක 1 ද
  B හා C පමණක් නිවැරදිනම් අංක 2 ද
  C හා D පමණක් නිවැරදිනම් අංක 3 ද
  A හා C පමණක් නිවැරදිනම් අංක 4 ද

  ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම් අංක 5 ද වරහන තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | Aහා C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

26. පුනරුදය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ / ප්‍රකාශය නිවැරදි වේ ද ?
   A) ඉතාලියෙන් ආරම්භ වූ පුනරුදය යුරෝපයේ සෙසු රටවල් කරා ව්‍යාප්ත විය.
   B) පුනරුදයේ බලපෑම හේතුකොටගෙන යුරෝපයේ සමාජ, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික හා ආගමික අංශවල පුළුල් විපර්යාසයක් සිදුවිය.
   C) පුනරුදයෙන් ආරම්භ වූ මෙම පරිවර්තන යුගය යුරෝපයේ නූතන යුගයේ උදාවට හේතුවිය.
   D) පුනරුද සමයේ ගෘහ නිර්මාණ කලාව භෞතික සම්ප්‍රදායට නැඹුරු වූවකි. (.....)

27. යුරෝපයේ ජාතික රාජ්‍ය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ / ප්‍රකාශය නිවැරදි වේ ද ?
A) පහළොස්වන හා දහසයවන සියවස්වල යුරෝපයේ නැගී ආ සුවිශේෂී දේශපාලන සංවිධාන ජාතික රාජ්‍ය ලෙස හැඳින්වේ.
B) බලවත් ස්වෛරී රාජාණ්ඩුව ජාතික රාජ්‍යවල බිහිවිය.
C) ශක්තිමත් ප්‍රාදේශීය පාලකයන් පිරිසක් දක්නට ලැබේ.
D) වංශාධිපති ප්‍රභූන් රාජ සභාවේ උසස් නිලධාරීන් වූහ. (.....)

28. වියානා සම්මේලනයේ ප්‍රතිඵල කවරේ ද ?
A) යුරෝපයේ රටවල් ඇතිවන ප්‍රශ්න සාකච්ඡා මඟින් විසඳා ගැනීමට සම්මේලන ක්‍රමය යොදා ගැනීම.
B) පැරණි රජ පෙළපත්වල හා අධිරාජ්‍යවල අයිතිවාසිකම් හෙවත් නීත්‍යානුකූලවාදය පිලිගැනීම.
C) ලිබරල්වාදී අදහස් යටපත් කිරීම.
D) බ්‍රිතාන්‍ය විදේශ ඇමති කාසල්රී සම්මේලනයේ මූලිකත්වය ගැනීම. (.....)

29. එක්සත් ජාතීන්ගේ සංවිධානය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශය නිවැරදි වේ ද ?
A) 1945 දී සැන්ප්‍රැන්සිස්කෝ නගරයේ පැවැත් වූ සමුළුවේ දී එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සකස් කරන ලදී.
B) ආරම්භයේ දී රටවල් 61 කි. (හැට එකක්) ප්‍රඥප්තියට අත්සන් තබන ලදි.
C) ප්‍රධාන ආයතන 6 කින් සමන්විත වන අතර මහ ලේකම්වරයා ප්‍රධාන පරිපාලන නිලධාරියා වේ.
D) මූලස්ථානය නෙදර්ලන්තයේ හේග් නුවර පිහිටා ඇත. (.....)

30. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව ලෝක දේශපාලනයේ හැසිරීම කෙබඳු වී ද ?
A) නිරවි යුද්ධය ඇති වීම.
B) අධිරාජ්‍යවාදයෙන් නිදහස ලැබූ රටවල් ධනවාදයට සහායදීම.
C) සෝවියට් දේශය වෝර්සෝ සංවිධානයටත් ඇමෙරිකා එක්සත් ජනපදය නේටෝ සංවිධානයටත් සහාය දීම.
D) සමාජ වාදය ව්‍යාප්ති කිරීම සඳහා සෝවියට් දේශය විසින් මාෂල් සැලැස්ම හඳුන්වා දීම. (.....)

- **අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. පුරාණ ඇතන්ස් රාජ්‍යයට ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ ලබාදුන් පාලකයා කවු ද ?
1. ක්ලයිස්තීනිස් 2. පෙරික්ලීස් 3. ඇරිස්ටෝටල්
4. සීසර් 5. කොන්ස්ටන්ටයින් (.....)

32. රෝම අධිරාජ්‍යයේ ප්‍රථම අධිරාජ්‍යා කවු ද ?
1. පොම්පෙයි 2. ජුලියස් සීසර් 3. ඔගස්ටස් සීසර්
4. මාකස් අවුරේලියස් 5. තියඩෝසියස් (.....)

33. නැන්ටීස් ආඥාව මඟින් හියුනනෝවරුන්ට ආගමික නිදහස ලබාදුන් ප්‍රංශ පාලකයා,
1. පිලිප් ඔගස්ටස් 2. IV හෙන්රි 3. IV පිලිප්
4. නවවන ලූවී 5. දහහතරවන ලූවී (.....)

34. තිස් අවුරුදු යුද්ධය නිම කිරීමට මූලික වූ ගිවිසුම කුමක් ද ?
1. වෙස්ට්ෆේලියා ගිවිසුම 2. ප්‍රාග් ගිවිසුම 3. ලුබෙක් සාම ගිවිසුම
4. පැරිස් ගිවිසුම 5. ඒමියන්ස් ගිවිසුම (.....)

35. මිත්‍ර ජාතීන් එක් වී නැපෝලියන් බොනපාට් අවසන් වශයෙන් පරාජය කළ සටන,

1. ට්‍රැෆල්ගාර් සටන  2. ඔස්ටර්ලිස්ට් සටන  3. ජීනා සටන
4. ලිප්සිග් සටන  5. වෝටර්ලු සටන  (.....)

- **36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැලපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,2,3,4 හා 5 යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 36. ක්‍රි.ව. 1453 ඔටෝමන් තුර්කීන් කොන්ස්තන්තිනෝපලය යටත් කර ගැනීම පුනරුදයට බලපෑ ප්‍රධාන හේතුවක් විය. | ඇරගන්හි ෆර්ඩිනන්ඩ් කුමරා සහ කැස්ටීල්හි ඉසබෙලා කුමරිය ස්පාඤ්ඤය තුළ වැඩවසම්වාදය ශක්තිමත් කිරීමට කටයුතු කළහ. (.....) |
| 37. දේශ ගවේෂණවල ප්‍රතිඵලයක් වශයෙන් ආසියා අප්‍රිකා, ලතින් ඇමෙරිකා මහාද්වීපවල යුරෝපා බලය ව්‍යාප්ත විය. | ඇමෙරිගෝ වෙස්පූෂි නව ලෝකය හෙවත් ඇමෙරිකාව සොයා ගැනීම එහි බටහිර ජාතීන් ජනපද පිහිටුවීමට මඟ පෑදීය. (.....) |
| 38. ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය බිහි වන්නේ රෙපරමාදු ව්‍යාපාරය ශක්තිමත් කරන අතරම කතෝලික ආගම දුර්වල කිරීම සඳහාය. | ප්‍රංශ විප්ලවය ඇති වූයේ 16 වන ලූවී රජුගේ පාලන සමයේ වුවත් ඊට බලපෑ දේශපාලන ආර්ථික ගැටලු වර්ධනය වන්නේ 14 ලූවී රජුගේ පාලන සමයේ සිටයි. (.....) |
| 39. 1848 විප්ලව ඉතා කෙටි කාලයක් තුළ යුරෝපයේ නගර බොහොමයක පැතිර ගියේය. | 1848 පෙබරවාරි මස 22 සහ 24 අතර පැරීසියේ ඇති වූ විප්ලවය 1848 මාර්තු 13 සහ 18 අතර කාලයේ වියානා, මිලාන්, වෙනිස් හා බර්ලින් යන නගරවල ජනතා නැගිටීම් කෙරෙහි බලපෑවේය. (.....) |
| 40. ජර්මනියේ වෛමාර් සමූහාණ්ඩුවේ දුර්වලතා හේතුකොටගෙන ෆැසිස්ට්වාදයේ නැගී සිටීම තුළින් හිට්ලර් තම බලය තහවුරු කර ගත්තේය. | දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව ප්‍රංශයේ හා බ්‍රිතාන්‍යයේ යටත් විජිත අධිරාජ්‍ය බිඳ වැටී සෝවියට් දේශය හා ඇමෙරිකාව සමාජවාදය හා ධනවාදය මුල්කර ගනිමින් ලෝක බලවතුන් ලෙස ඉදිරියට පැමිණියහ. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

| 25B | S | II |
|---|---|---|

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Third Term Test - Grade 13 - 2019**

විභාග අංකය ............................ යුරෝපා ඉතිහාසය II

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් එක බැගින් තෝරාගෙන ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න.**
  **(පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා යුරෝපයේ දළ සිතියමක් සපයා ඇත.)**

## A කොටස

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

(i) ඩැනියුබ් ගඟ (ii) ක්‍රීටය (iii) කාර්තේජය (iv) අද්‍රියාතික් මුහුද (v) ලිවර්පූල්

(vi) පෘතුගාලය (vii) අද්‍රියානෝපල් (viii) සිසිලය (ix) බෙල්ජියම (x) ඉංග්‍රීසි ඕඩය

(xi) යූරල් කඳුවැටිය (xii) ජිබෝල්ට්‍රා සමුද්‍ර සන්ධිය (ල. 12)

## B කොටස

02. පහත දැක්වෙන මාතෘකා යටතේ රෝම ශිෂ්ටාචාරයේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.

(i) පාලන ක්‍රමය (ii) ආගම (iii) ගෘහ නිර්මාණ ශිල්පය (ල. 16)

03. ''කාර්මික විප්ලවය හේතු කොටගෙන යුරෝපයේ තාක්ෂණික, ආර්ථික, සමාජීය හා දේශපාලන යන සියලු අංශයන් හි මූලික පරිවර්තනයක් සිදුවිය''

(i) කාර්මික විප්ලවය මුලින්ම එංගලන්තයෙන් ආරම්භ වීමට තුඩු දුන් සාධක පරීක්ෂා කරන්න. (ල. 6)

(ii) කාර්මික විප්ලවයේ ප්‍රතිඵල ඇසුරින් ඉහත ප්‍රකාශය පරීක්ෂා කරන්න. (ල. 10)

04. ''ප්‍රංශ විප්ලවය ආරම්භ කරන ලද්දේ මධ්‍යම පන්තිය විසිනි.''

(i) ප්‍රංශ විප්ලවය සමයේ ප්‍රංශයේ සිටි පාලකයා නම් කරන්න. (ල. 1)

(ii) විප්ලවය ආසන්න සමයේ ප්‍රංශයේ පැවති දේශපාලන, ආර්ථික සමාජ පසුබිම ප්‍රංශ විප්ලවයට මඟ පෑදූ ආකාරය පැහැදිලි කරන්න. (ල. 7)

(iii) යුරෝපයේ සෙසු රටවලට සාපේක්ෂව ප්‍රංශයේ මධ්‍යම පන්තියට තිබූ ගැටළු කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය විමසන්න. (ල. 8)

05. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ප්‍රති රෙපරමාදු ව්‍යාපාරය

(ii) නැපෝලියන් බොනපාට්

(iii) ස්පාඤ්ඤ දේශ ගවේෂණ ව්‍යාපාරය

(iv) බ්‍රිතාන්‍යයේ දේශපාලන පක්ෂ ක්‍රමය

(එක් කෙටි සටහනකට ලකුණු 08 බැගිනි)

## C කොටස

06. (i) ''ඉතාලිය එක්සත් කිරීම නායකයන් තිදෙනෙකුගේ උත්සාහයක ප්‍රතිඵලයකි.''

(ii) ඉතාලිය එකත්සත් කිරීමට එරෙහිව පැවති බාධක කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 8)

(iii) ඉතාලිය එක්සත් කිරීමෙහිලා මැසිනි, කැවුර් හා ගැරිබෝල්ඩි යන නායකයන් ගේ දායකත්වය විමසන්න. (ල. 8)

07. ''රුසියානු විප්ලවය ලෝක දේශපාලනයේ ප්‍රධාන සන්ධිස්ථානයක් විය.''

(i) 1917 බෝල්ෂෙවික් විප්ලවය ඇති වීමට තුඩු දුන් සාධක විග්‍රහ කරන්න. (ල. 8)

(ii) 1917 විප්ලවයේ ජයග්‍රහණ හා එහි බලපෑම් ඇසුරින් ඉහත ප්‍රකාශය විමසන්න. (ල. 8)

08. ''දෙවන ලෝක යුද්ධය ඇති වීමට මුල් වූ බීජ පළමුවන ලෝක යුද්ධයේ ප්‍රතිඵල තුළ ගැබ්ව තිබුණි.''

(i) දෙවන ලෝක යුද්ධය ආසන්න සමයේ ඉතාලියේ සහ ජර්මනියේ පැතිර තිබූ දේශපාලන දර්ශන දෙක නම් කරන්න. (ල. 2)

(ii) පළමුවන ලෝක යුද්ධයෙන් පසුව නැවතත් ලෝක යුද්ධයක් ඇතිවීමට බලපෑ හේතු ඉහත ප්‍රකාශය ඇසුරින් විමසන්න. (ල. 7)

(iii) දෙවන ලෝක යුද්ධයෙන් උද්ගත වූ ප්‍රතිඵල විග්‍රහ කරන්න. (ල. 7)

09. පහත දැක්වෙන මාතෘකා අතරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) වියානා සම්මේලනය

(ii) ජාතීන්ගේ සංගමය


(ii) නිරවි යුද්ධය

(iv) නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය

(එක් කෙටි සටහනකට ලකුණු 8 බැගිනි)

# 12 / 13 **යුරෝපා ඉතිහාසය** - 12 / 13 ஐரோப்பிய வரலாறு

| විභාග අංකය<br>சுட்டெண் | |
|---|---|




## තෙවන වාර පරීක්ෂණය 2019 - යුරෝපා ඉතිහාසය
## පිළිතුරු 13 - ශ්‍රේණිය
## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **01. -** | 5 | **11. -** | 5 | **21. -** | 3 | **31. -** | 1 |
| **02. -** | 4 | **12. -** | 2 | **22. -** | 4 | **32. -** | 3 |
| **03. -** | 1 | **13. -** | 4 | **23. -** | 5 | **33. -** | 2 |
| **04. -** | 3 | **14. -** | 5 | **24. -** | 4 | **34. -** | 1 |
| **05. -** | 3 | **15. -** | 5 | **25. -** | 33 | **35. -** | 5 |
| **06. -** | 1 | **16. -** | 3 | **26. -** | 5 | **36. -** | 2 |
| **07. -** | 5 | **17. -** | 1 | **27. -** | 1 | **37. -** | 1 |
| **08. -** | 4 | **18. -** | 2 | **28. -** | 1 | **38. -** | 3 |
| **09. -** | 2 | **19. -** | 5 | **29. -** | 4 | **39. -** | 5 |
| **10. -** | 1 | **20. -** | 5 | **30. -** | 4 | **40. -** | 1 |

## II කොටස

01.



## B කොටස

02. (i) * ආරම්භයේ දී රාජාණ්ඩු ක්‍රමය පැවතීම. * ප්‍රධාන පුරවැසියන්ගෙන් සමන්විත සමුහාණ්ඩු ක්‍රමය ඇති වීම.
* එම සමුහාණ්ඩුව තුල සෙනෙට් සභාව බලවත් වීම.* සෙනෙට් සභාවෙන් පාලකයා තෝරා ගැනීම.
* කොන්සල්වරු දෙදෙනාගේ පාලනය. * අධිරාජ්‍ය ගොඩ නැඟීම.
* අධිරාජ්‍යවාදය බිහි වීම. * රෝම නීතිය හා පරිපාලනය

(ii) * ස්වාභාව ධර්මයට වන්දනාමාන කිරීම. * භූතාත්ම වන්දනා කිරීම.
* මව් දෙවඟනට වැඳුම් පිදුම් කිරීම. * ග්‍රීක ආගමික විශ්වාස හා දෙවිවරු අතර තිබූ සමානතා.

(iii)* පොදු ගොඩනැගිලි ඉදි කිරීම. * විශාල ආරුක්කු
* සුව පහසු නාන කාමර * නගර අලංකාරය
* කොලොසියම්, බැසිලිකාව * ගෝලාකාර ශිඛර ආදිය විස්තර කිරීම. (ල. 16)

03. (i) * යුරෝපයේ සෙසු රටවලට සාපේක්‍ෂව වැඩවසම් වාදය බිඳ වැටී තිබීම.
* නිදහස් සමාජ පරිසරය. * දේශපාලන ස්ථාවරත්වය.
* ස්වාභාවික සම්පත් බහුලවීම. * ධනවතුන්ගේ අනුග්‍රහය.
* භූගෝලීය පිහිටීම. * ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය.
* බැංකු හා මූල්‍ය සමාගම්. (ල. 6)

(ii) * මහා පරිමාණ කර්මාන්ත බිහි වීම. * ආර්ථිකයේ සියලු අංශවල දියුණුව.
* කෘෂි කර්මාන්තයේ සම්ප්‍රදායික මුහුණුවර වෙනස් වීම. * කර්මාන්ත හා වෙළඳාම ප්‍රධාන වීම.
* ධනවාදී ආර්ථිකය. * සමාජ ස්ථරායනය (ධනපති හා නිර්ධන)
* මධ්‍යම පන්තියේ බිහිවීම. * දේශපාලන දර්ශන බිහිවීම.
* ඇඩම්ස්මිත්ගේ රාජ්‍ය නිර්බාධවාද වාදය. * මාක්ස්වාදය.
* උපයෝගිතාවාදය

රොබට් ඕවන්ගේ සමූපකාර ව්‍යාපාරය යන කරුණු ඔස්සේ පිළිතුර ගොඩ නගා තිබිය යුතුය. (ල. 10)

04. (i) දහසයවන ලුවී (ල. 1)

(ii) **දේශපාලන**
* ප්‍රබල රාජාණ්ඩුව * වැඩවසම් ක්‍රමය * රජවරු අනවශ්‍ය යුද්ධවලට සහභාගි වීම
* දහසයවන ලුවී රජුගේ අදූරදර්ශී පාලනය
* බර්තෝලමියු දියෙස් හා වස්කෝද ගාමාගේ දේශගවේශන

**ආර්ථික**
* සාමාන්‍ය ජනතාව මත පටවා තිබූ අධික බදු බර * රදලයින්ගේ අධි සුඛෝපභෝගී හා වරප්‍රසාද
* රජ පවුලේ අනවශ්‍ය යුද වියදම් * භාණ්ඩාගාරය බංකොලොත් වීම.
* ඊඩන් වෙළඳ ගිවිසුමේ අවාසි

**සමාජයීය**
* සාමාන්‍ය ජනතාවගේ ජීවිතවල ගැටලු * වැඩවසම් සමාජ ලක්‍ෂණ (ල. 7)

(iii)* දේශපාලන අයිතිවාසිකම් අහිමි වීම.
* උගතුන් බුද්ධිමතුන් ද තුන්වන ප්‍රජා ගණයට අයත්වීම.

05. මාතෘකාවට අනුව කරුණු දැක්වීම බලා ලකුණු ලබා දෙන්න. (ල. 8 x 2 =16)

06. (i) * ඉතාලියේ පැවති දේශපාලන බෙදීම්
* නේපල්ස් සහ සිසිලි ස්පාඤ්ඤයේ බූර්බෝන් පෙළපත යටතේ පාලනය වීම.
* රෝමය සහ මධ්‍යම ඉතාලිය පාප්තුමා යටතේ පාලනය වීම.
* පාර්මා, මොඩීනා සහ ටස්කනි ඕස්ට්‍රියානු අධිරාජ්‍යයට අයත් වීම.
* වෙනිස්, ලොම්බාඩ් යන ප්‍රදේශ ඕස්ට්‍රියානු පාලනයට යටත් කර තිබීම.
* ඉතාලි රජ පෙළපතට පීඩ්මොන්ට් හා සැවෝයි පමණක් අයත් වීම.
* ලිබරල්වාදී අදහස් මර්දනය කිරීම.
* ඕස්ට්‍රියානු ආධිපත්‍ය (ල. 8)

(ii) * මැසිනිගේ තරුණ ඉතාලි ව්‍යාපාරයේ වැදගත්කම.
* කවුන්ට් කැවුර් පීඩ්මොන්ට් රාජ්‍යයේ අගමැති තනතුරට පත්වීමෙන් පසු ඔහුගේ කාර්යභාරය.
* ප්‍රංශය හා බ්‍රිතාන්‍ය සමඟ ඇති කරගත් දේශපාලන සබඳතා.
* ගැරිබෝල්ඩි ගේ හමුදාමය ක්‍රියාමාර්ග.
* ඉතාලි වැසියන් තුළ ජාතිකානුරාගය ඇති කිරීමට ගත් ප්‍රයත්න. (ල. 8)

07. (i) ***ගුරු මාර්ගෝප සංග්‍රහය - 13 වසර පිටු අංක 166*** (ල. 8)

(ii) * ලොව ප්‍රථම සමාජවාදී රාජ්‍යය බිහි වීම.
* සමාජවාදය මත පදනම් වූ ආර්ථික දර්ශනය ප්‍රායෝගික වැඩ පිළිවෙලක් වීම.
* කම්කරු පන්තියේ නැගී සිටීම.
* නිර්ධන පන්තියේ ආශ්‍වාදායකත්වය.
* සමාජවාදී අදහස් ලොව පුරා ව්‍යාප්ත වීම.
* ආණ්ඩු පිහිටුවීමට විප්ලවය යොදා ගැනීමේ ආදර්ශයක් වීම.
* චීනය, කියුබාව, උතුරු කොරියාව, වියට්නාමය යන රටවල්වල සමාජවාදී පාලන ක්‍රම පිහිටු වීම. (ල. 8)

08. (i) * ෆැසිස්ට් වාදය - ඉතාලිය * නට්සිවාදය (නාසිවාදය) - ජර්මනිය (ල. 2)

(ii) * ජාතීන්ගේ සංගමයේ තිබූ දුර්වලතා.
* ජර්මනිය ජාතීන්ගේ සංගමයට බඳවා නොගැනීම.
* ජර්මනියට ලබාදුන් දඬුවම් නිසා ජර්මනිය ආර්ථික වශයෙන් දුර්වල වීම.
* දුර්වල ආර්ථිකය හේතුවෙන් දේශපාලන අස්ථාවර බව ඇති වීම.
* ෆැසිස්ට්වාදයට මතුවීමට හැකිවීම. (ල. 7)

(iii)* විශාල මිනිස් ජීවිත හා දේපල විනාශය. * ජර්මනිය විනාශ වීම.
* ජපානයට බෝම්බ හෙලීමේ දිගුකාලීන ප්‍රතිවිපාක. * ලෝක දේශපාලන බල තුලනය වෙනස්වීම.
* අධිරාජ්‍යවාදය බිඳ වැටීම. * එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහිවීම.
* සමාජ වාදයේ හා ධනවාදයේ තරඟකාරිත්වය. (ල. 7)

09. අදාල කරුණු සඳහා ලකුණු ලබා දෙන්න. (ල. 8 x 2 =16)